3 පරිච්ඡේදය


# ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ

කිසියම් ප්‍රදේශයක කිසියම් කාලච්ඡේදයක් තුළ ඒකරාශී වී ඇති ජන සමූහය ජන සංඛ්‍යාව ලෙස නිර්වචනය කළ හැකි ය. ජන සංඛ්‍යාව රටකට සම්පතකි. ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රධාන ලක්ෂණ කීපයක් හඳුනා ගෙන ඇත. ඒවා අතර ජන සංඛ්‍යාවේ විශාලත්වය, ව්‍යාප්තිය, සංයුතිය හා ව්‍යුහය, වර්ධනය, වෙනස්කම් සහ සංක්‍රමණ පෙන්වා දිය හැකි ය.


## 3.1 ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය

අවුරුදු දහස් ගණනකට වැඩි කලක් තිස්සේ ජන සංඛ්‍යාව සීමිත විය. එඬේර යුගයේ දී හා දඩයම් යුගයේ ද මිනිසාගේ ජීවන රටාව තීරණය වූයේ තැනින් තැනට ගොස් ආහාර රැස් කිරීමේ පදනම මත ය. එකල විසිරී ගිය කුඩා ජන සංඛ්‍යාවක් විය. මිනිසාගේ ජීවන රටාව ද්‍රව්‍ය එක්රැස් කිරීම වෙනුවට ආහාර ද්‍රව්‍ය නිපදවා ගැනීමේ ක්‍රමය දක්වා වෙනස් වූ බැවින්, ජන සංඛ්‍යාවේ විශාල වෙනසක් සිදු විය. තැනින් තැනට ගිය මිනිසා එක ස්ථානයක දීර්ඝ කාලයක් රැඳීමේ ජීවන ක්‍රමයට අවතීර්ණ විය. මිනිසා තම ශ්‍රමය මඟින් භෞතික වස්තූන්ට අගයක් ප්‍රදානය කිරීම නිසා මිනිස් සම්පතේ වටිනාකම ද පෙරට වඩා ඉහළ ගොස් ඇත. එබැවින් ජන සංඛ්‍යාවේ විශාලත්වය ද ඉහළ අගයක් ගනියි. 2011 වර්ෂය අවසාන වන විට ලෝක ජන සංඛ්‍යාව බිලියන හත ඉක්මවා ඇත.

### මහාද්වීප අනුව ජන සංඛ්‍යාවේ විශාලත්වය




3.1 රූපය : මහාද්වීප අනුව ජන සංඛ්‍යාවේ විශාලත්වය
මූලාශ්‍රය : http://en.wikipedia.org/wiki/World_population - 2008




3.1 සිතියම : ලෝක ජන සංඛ්‍යා විශාලත්වය

මූලාශ්‍රය : එම්. ඩී. ගුණසේන 2003, ගුණසේන ෆිලිප් ලෝක සිතියම් පොත

## මහාද්වීප අනුව ජන සංඛ්‍යාවේ විශාලත්වය

ලෝකයේ මහාද්වීප අනුව ජන සංඛ්‍යා විශාලත්වයේ වෙනස්කම් දක්නට ඇත. ඒ ඒ මහාද්වීප වල ඇති විශේෂිත හේතූන් ඒවායේ ජන සංඛ්‍යාව කෙරෙහි බලපෑම් කර තිබේ. දේශගුණය, ඛනිජ සම්පත්, පස ආදී කරුණු උදාහරණ වශයෙන් පෙන්වා දිය හැකි ය. ලෝකයේ මහාද්වීප අනුව ජන සංඛ්‍යාවේ විශාලත්වය එකිනෙකින් වෙනස් වන බව පහත සඳහන් වගුවෙන් පෙනේ.

3.1 වගුව
මහාද්වීප අනුව ජන සංඛ්‍යා විශාලත්වය

(ජන සංඛ්‍යාව මිලියනවලින්)

| වර්ෂය | අප්‍රිකාව | ආසියාව | උතුරු ඇමරිකාව | ලතින් ඇමරිකාව | යුරෝපය | ඕෂනියාව | ඇන්ටාක්ටිකාව |
|---|---|---|---|---|---|---|---|
| 2011 | 973 | 4,054 | 337 | 577 | 732 | 34 | 04 |

මූලාශ්‍රය: http://en.wikipedia.org/wiki/World_population

## දකුණු ආසියාවේ ජන සංඛ්‍යා විශාලත්වය

ජන සංඛ්‍යාවේ විශාලත්වය කලාප අනුව මෙන් ම කලාපයක් තුළ ඇති රටවල් අනුව ද සලකා බැලිය හැකි ය. ඒ රටවල් තුළ ද ජන සංඛ්‍යාවේ විශාලත්වයේ වෙනස්කම් දක්නට ඇති බැව් 3.2 වගුවෙන් පෙන්වා දිය හැකි ය.

3.2 වගුව

දකුණු ආසියාවේ ජන සංඛ්‍යාව රටවල් අතර බෙදී ඇති අන්දම -2011

(ජන සංඛ්‍යාව මිලියනවලින්)

| ද.ආසියාව | ඉන්දියාව | පකිස්ථානය | බංග්ලා දේශය | නේපාලය | ශ්‍රී ලංකාව | භූතානය | මාල දිවයින |
|---|---|---|---|---|---|---|---|
| 1579.9 | 1210.2 | 179.2 | 142.3 | 26.6 | 20.6 | 0.7 | 0.3 |

මූලාශ්‍රය : http://en.wikipedia.org/wiki/World_population (2012.04.02)

## විශාලත්වය අනුව ප්‍රමුඛ රටවල ජන සංඛ්‍යාව

ජන සංඛ්‍යා විශාලත්වය අනුව ලෝකයේ ප්‍රමුඛ රටවල් 23ක් හඳුනා ගෙන ඇත. එහි සෑම රටක ම ජන සංඛ්‍යාව මිලියන 100කට අධික ව දක්නට ලැබේ. ඉන් රටවල් හයක් ම ආසියාවට අයත් වීම විශේෂ කරුණකි.

3.3 වගුව

ජන සංඛ්‍යාවේ පෙරමුණ ගත් රටවල්

| රට | ජන සංඛ්‍යාව (මිලියන) |
|---|---|
| චීනය | 1,347.3 |
| ඉන්දියාව | 1,210.2 |
| ඇ.එ.ජනපදය | 313.3 |
| ඉන්දුනීසියාව | 237.6 |
| බ්‍රසීලය | 192.4 |
| පාකිස්ථානය | 179.2 |
| නයිජීරියාව | 162.5 |
| රුසියාව | 143.0 |
| බංග්ලාදේශය | 142.3 |
| ජපානය | 127.6 |

මූලාශ්‍රය : http://en.wikipedia.org/wiki/List_of_countries_by_population (2011.04.02)

වර්ෂ 2050 සඳහා ප්‍රක්ෂේපිත ජන සංඛ්‍යාව අනුව ලෝකයේ රටවල් පෙළ ගැස්වූ විට ඉන්දියාව පෙරමුණ ගනු ඇත. දැනට ප්‍රමුඛත්වය ගන්නා චීනයට හිමි වනු ඇත්තේ දෙ වන ස්ථානය යි. දැනට තුන් වන ස්ථානය ගන්නා ඇ.එ. ජනපදය එසේ ම පවතින අතර නව වන ස්ථානයෙහි පසු වන නයිජීරියාව සිව්වෙනි ස්ථානයට පත් වනු ඇත. පහත සඳහන් සංඛ්‍යා ලේඛන වගුවෙන් එය පෙන්නුම් කෙරේ.

3.4 වගුව

ජන සංඛ්‍යා විශාලත්වය- 2050 (මිලියනවලින්)

| රට | ජන සංඛ්‍යාව | රට | ජන සංඛ්‍යාව | රට | ජන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ඉන්දියාව | 1,628 | පාකිස්ථානය | 295 | කොංගෝ | 183 |
| චීනය | 1,437 | ඉන්දුනීසියාව | 285 | ඉතියෝපියාව | 145 |
| ඇ.එ.ජනපදය | 420 | බ්‍රසීලය | 260 | | |
| නයිජීරියාව | 299 | බංග්ලාදේශය | 231 | | |

මූලාශ්‍රය : U.S Census Bureau International Data Base - 2006

**ක්‍රියාකාරකම්**

- ඉහත 3.4 වගුව අධ්‍යයනය කර තීරු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න.
- එම ප්‍රස්තාරයෙන් පිළිබිඹු කෙරෙන ප්‍රධාන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.

## 3.2 ජන සංඛ්‍යා ව්‍යුහය

**ජන සංඛ්‍යා ව්‍යුහය යනු ජන සංඛ්‍යාවට ඇතුළත් ස්ත්‍රීන් හා පුරුෂයින් වයස් කාණ්ඩ අනුව වර්ග කර දැක්වීම යි.**

ජන සංඛ්‍යාවක කොපමණ ප්‍රමාණයක් පුරුෂයින් ද කොපමණ ප්‍රමාණයක් ස්ත්‍රීන් ද යන ලක්ෂණය ජන සංඛ්‍යා ව්‍යුහයෙන් විස්තර කෙරේ. රටක ජන සංඛ්‍යාව වයස් හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදා දක්වන සටහන ජන සංඛ්‍යා පිරමීඩය යනුවෙන් හැඳින්වේ. එහි දැක්වෙන විවිධ කාණ්ඩ පහත පෙනෙන වයස් මට්ටම් අනුව එක් කොට දැක්වීම, ශ්‍රම හමුදාව හා යැපෙන්නන් වෙන් කර හඳුනා ගැනීමේ දී වඩාත් ප්‍රයෝජනවත් ය.


අවු 14ට අඩු බාල වයස් යැපෙන්නන්

අවු 15 64 අතර ශ්‍රම බලකාය

අවු 65ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසි යැපෙන්නන්


මෙම කාණ්ඩ තුනට අයත් ජන කොටස් එක සමාන ව විසිරී නොමැති බැවින් ජන සංඛ්‍යා පිරමීඩ විවිධ හැඩයන් ගෙන ඇත. ඉන් ප්‍රධාන හැඩ තුනක් හඳුනා ගෙන ඇත.

ප්‍රසාරණය | ස්ථාවර | හායනය





3.2 රූපය : ප්‍රසාරණ පිරමීඩය

- අවුරුදු 14ට අඩු යැපෙන්නන් වැඩි ය.
- අවුරුදු 65ට වැඩි යැපෙන්නන් අඩු ය.
- සංවර්ධනය වෙමින් පවතින රටවල මෙවැනි පතුල බර පිරමීඩයක හැඩැති ජන සංඛ්‍යා ව්‍යුහයක් ඇත.



3.3 රූපය : ස්ථාවර පිරමීඩය



3.4 රූපය : හායන පිරමීඩය


- ඉතා අඩු උපත්, අඩු මරණ අනුපාතයක් ඇති බැවින් ජන සංඛ්‍යා වර්ධනය අඩු ය.
- වයස්ගත යැපෙන්නන්ගේ සංඛ්‍යාව ඉහළ ය.
- බැරලයක හැඩය ගනියි.

- ස්වාභාවික වර්ධනය පහළ මට්ටමක ඇත.
- වර්ධන වේගය 1% පමණ වේ.
- පහළ යැපෙන්නන්ගේ අනුපාතය අඩු වන අතර ඉහළ යැපෙන්නන් වැඩි වේ.
- දරුවන් හද වඩා ගැනීම සීමා කර ඇත.
- අනාගතයේ දී ස්ථම්භ ප්‍රස්තාරයක ස්වරූපයක් ගැනීමට ඉඩ ඇත.


මෙම පිරමීඩවල ජන සංඛ්‍යාවේ උපත් අනුපාතිකය, මරණ අනුපාතිකය, ජන සංඛ්‍යාවේ වර්ධනය සහ ජන සංඛ්‍යාවේ වෙනස්වීම් අන්තර්ගත වී ඇත.

**ක්‍රියාකාරකම්:**

- ප්‍රසාරණ මට්ටමේ ජන සංඛ්‍යා පිරමීඩ ඇති රටවල් 10ක නම් ලියන්න.
- වයස්ගත ජන සංඛ්‍යාව වැඩි වීම නිසා යුරෝපා රටවල් මුහුණ දී ඇති ගැටලු තුනක් විස්තර කරන්න.
- මරණ අනුපාතිකය පහළ මට්ටමක් ගනු ලැබීමට හේතු වන කරුණු තුනක් පැහැදිලි කරන්න.



A



B

- ලෝක සිතියම් පොත ඇසුරු කර ගනිමින් මෙවැනි හැඩැති පිරමීඩ ඇති රටවල් සඳහා උදාහරණ තුන බැගින් ලෝක ලියන්න.
- "A" සහ "B" ජන සංඛ්‍යා පිරමීඩවලට අයත් රටවල ජන සංඛ්‍යා වයස් කාණ්ඩ සසඳන්න.
- "A" පිරමීඩයේ පතුල පළල් වූ හැඩයක් ගැනීමට හේතු වූ කරුණු තුනක් පැහැදිලි කරන්න.

## 3.3 ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය

**ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ අසමාන ලෙස ව්‍යාප්ත වී තිබීම යි.**

ප්‍රධාන ජනාධික කලාපවලට ලෝක භූමි ප්‍රමාණයෙන් 10%ක් අයත් වන අතර එවායේ ලෝක ජන සංඛ්‍යාවෙන් 64% ජීවත් වේ.

ඕස්ට්‍රේලියාවේ ජනඝනත්වය ව.කි. මීටරයකට තුනකි. එහි ජන සංඛ්‍යාව මිලියන 19ක් පමණ වේ.

ලෝක ජන සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ ජීවත් වන්නේ 5%ක පමණ භූමි ප්‍රදේශයක ය.

ලෝක ජන සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ ආසියාවේ ජීවත් වේ.




මුළු ජන සංඛ්‍යාවෙන් 60%ක් ම ප්‍රධාන රටවල් 10ක ජීවත් වේ.

උතුරු අර්ධ ගෝලයේ 50%ක් පමණ ජීවත් වන්නේ උතුරු අක්ෂාංශ $10^0$ ත් $40^0$ අතර තීරයේ ය.

ලෝක ජන සංඛ්‍යාවෙන් 90%ක් පමණ උතුරු අර්ධ ගෝලයේ ජීවත් වේ.

ඉහත උපුටා ගැනීම්වලට අනුව ලෝක ජන ව්‍යාප්තියේ විෂමතාවන් ඇති බැව් පැහැදිලි වේ. ලෝක ජන ව්‍යාප්තිය ගණනය කරනු ලබන්නේ කිසියම් රටක ජීවත් වන ජන සංඛ්‍යාව අනුව ය. රටක් තුළ ජන ව්‍යාප්තිය ගණනය කිරීම සඳහා එහි පවත්නා පරිපාලන ඒකක පදනම් කර ගනු ලැබේ.

**ජන ඝනත්වය යනු නිශ්චිත බිම් ඒකකයක් තුළ ජීවත් වන මිනිසුන් ප්‍රමාණය යි. එය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ.**

### ලෝකයේ පුළුල් ජනව්‍යාප්ති කලාප

**1. ජනාධික කලාප**

- වයඹ දිග යුරෝපය
- දකුණු ආසියාව
- නැගෙනහිර ආසියාව
- අග්නිදිග ආසියාව


**2. ජනහීන කලාප**

- උතුරු ඇමරිකාවේ උතුරු කොටස
- දකුණු ඇමරිකාවේ නිවර්තන ප්‍රදේශ (ඇමර්සන් වනාන්තර)
- යුරේෂියාවේ උතුරු කොටස
- ආසියාවේ මධ්‍යම ප්‍රදේශ
- ඕස්ට්‍රේලියාවේ මධ්‍යම ප්‍රදේශය
- අප්‍රිකාවේ සහරා කාන්තාරය ආශ්‍රිත ප්‍රදේශය කොංගෝ වනාන්තර

**3. මධ්‍යස්ථ කලාප**

- ඉහත දැක්වූ ප්‍රදේශ හැර සෙසු ප්‍රදේශ

ලෝකයේ ජන සංඛ්‍යා ව්‍යාප්ත වී ඇති ආකාරය පහත සිතියමෙන් දක්වේ.



3.2 සිතියම: ලෝක ජන ව්‍යාප්තිය

මූලාශ්‍රය: John Hancock and Alan Boult, 2001, G.C.S.E Geography Revise Study Guide

## ජන සංඛ්‍යාවේ ව්‍යාප්තියට බලපාන සාධක

| භෞතික සාධක | මානව සාධක | ඓතිහාසික සාධක |
|---|---|---|
| දේශගුණය | කෘෂිකර්මය | ප්‍රධාන ශිෂ්ටාචාර |
| භූ විෂමතාව | සංස්කෘතිය | දේශ ගවේෂණය |
| ස්වාභාවික වෘක්ෂලතා | යටිතල පහසුකම් | යටත් විජිතකරණය |
| ඛනිජ සම්පත් | රාජ්‍ය ප්‍රතිපත්ති | |
| ජලසම්පත් | කර්මාන්ත | |
| පස | වෙළෙඳාම | |

## ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක

ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. ඊසානදිග ඇමරිකාව හා බටහිර යුරෝපයේ ජන ව්‍යාප්තියට බලපාන සාධක දකුණු හා අග්නි දිග ආසියාතික රටවල ජන ව්‍යාප්තියට හේතු වී ඇති කරුණුවලට වඩා වෙනස් වේ. දකුණු ආසියාව හා නැගෙනහිර ආසියාව තුළ ලෝකයේ ජනාධික ම රටවල් දෙක වන චීනය හා ඉන්දියාව පිහිටා තිබේ. එම රටවල් ඈත අතීතයේ සිට ම ජනාවාස වී තිබුණු බවට ඉන්දු නිම්න හා හොවැංහෝ ශිෂ්ටාචාර සාක්ෂි දරයි. වසරකට එක් වරක්වත් පිටාර ගලන හොවැංහෝ, සින්දු සහ ගංගා නදීන් ආශ්‍රිත ව සාරවත් පස් දක්නට ලැබීම කෘෂිකාර්මික කටයුතුවලට ඉතාමත් ප්‍රයෝජනවත් වේ. මෝසම් වැසි

නිසා නිවර්තන හා උප නිවර්තන ප්‍රදේශවල හිතකර දේශගුණික ලක්ෂණ තිබීම නිසා කෘෂිකාර්මික කටයුතුවලට යෝග්‍ය වීම ජනාධික වීමට බලපාන ලද ප්‍රධාන හේතුව ලෙස පෙන්වා දිය හැකි ය. එම කලාපවල කෘෂිකර්මය මඟින් අධික ජන සංඛ්‍යාවක් පෝෂණය කිරීමට සිදු වී තිබේ. විවිධ ඛනිජ සම්පත්වල පිහිටීම, ඒවා ලබා ගැනීමේ තාක්ෂණික හැකියාව, යටිතල පහසුකම් දියුණු වීම, ඓතිහාසික වශයෙන් කාර්මික විප්ලවය ඇති වීම වැනි කරුණු නිසා බටහිර යුරෝපය වැනි ප්‍රදේශ ලෝකයේ ප්‍රධාන කාර්මික කලාප බවට පත් වී ඇති අතර අග්නිදිග ආසියාවේ මැලේෂියාව, සිංගප්පූරුව වැනි රටවල් මෑතක සිට ශීඝ්‍ර කාර්මික දියුණුවක් ලබා ඇත. ඒ තුළින් ඇති වූ ශීඝ්‍ර සංවර්ධනය නිසා ජනතාව එම ප්‍රදේශවලට ඇදී ඒමෙන් එම කලාප ජනාධික ප්‍රදේශ බවට පත් වී තිබේ. මීට අමතර ව දියුණු අධ්‍යාපනය, සෞම්‍ය කලාපීය දේශගුණයක් පැවතීම, ධීවර, දැව වැනි කර්මාන්ත දියුණු වීම නිසා රැකියා බහුල වීම හේතුකොට ගෙන ද එම ප්‍රදේශවලට ජනයා ඒකරාශී වී ඇත.

ආක්ටික් සහ ඇන්ටාක්ටික් කලාප ජන හීන හෝ ජනශූන්‍ය බවට පත් වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම දේශගුණික සාධක මත ය. උෂ්ණත්වය සීමාසහිත වීම මෙයට අදාළ මූලික හේතුව ලෙස පෙන්වා දිය හැකි ය. බටහිර ඕස්ට්‍රේලියාව, සහරා කාන්තාරය වැනි ප්‍රදේශවල වර්ෂාපතනය සීමා සහිත වීම නිසා ශාක වර්ධනයට බාධා පැමිණ ඇති අතර අධික උණුසුම සහ දරුණු නියං ජන ශූන්‍ය වීමට හේතු වී ඇත. ඉන්දියාව, චීනය ජනාධික ප්‍රදේශ වුවත් එහි ඇතැම් කලාපවල ඉහත සාධක හේතුවෙන් ජන ශූන්‍ය ස්ථාන දක්නට ලැබේ. උදා: ඉන්දියාවේ ථාර් කාන්තාරය පෙන්වා දිය හැකි ය. හිමාලය කඳු, ඇන්ඩීස් කඳු, රොකී කඳු ජන ශූන්‍ය ප්‍රදේශ බවට පත්ව ඇත්තේ දළ බෑවුම් ප්‍රදේශ, ගොඩනැගිලි, වාරිමාර්ග වැනි ඉදිකිරීම් කටයුතුවලට මෙන් ම කෘෂිකර්මයට ද යෝග්‍ය නො වන හෙයිනි.



3.5 රූපය : ජන ශූන්‍ය කාන්තාර ප්‍රදේශයක්


ඇමසන් වනාන්තර හා කොංගෝ වනාන්තර ද ජන ශූන්‍ය කලාප වේ. ඊට හේතුව අධික වර්ෂාපතනය හා අධික උෂ්ණත්වයයි. මේවා කෘෂිකාර්මික කටයුතු සඳහා එළි කිරීමට අපහසු වන අතර මිනිසාගේ සෞඛ්‍යයට අහිතකර රෝග බෝ කරන මැසි මදුරුවන් වැනි කෘමීන් ගහන නිසා ජන ශූන්‍ය ප්‍රදේශ බවට පත් ව තිබේ. උතුරු අර්ධ ගෝලයේ තුන්ද්‍රා ප්‍රදේශ ද ජන ශූන්‍ය වී ඇත්තේ ඒවායේ පවතින ඉතා අහිතකර ශීත දේශගුණික තත්ත්වයන් නිසා ය.



රූප අංක 3.6: ජන ශූන්‍ය හිම සහිත ප්‍රදේශයක්

## ග්‍රාමීය නාගරික වශයෙන් ජන ව්‍යාප්තිය

ලෝකයේ ග්‍රාමීය හා නාගරික වශයෙන් ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී ඇති ආකාරය සලකා බැලීමේ දී සංවර්ධිත රටවල සහ සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා ව්‍යාප්තිය එක සමාන නො වීම ද විශේෂ ලක්ෂණය කි. සංවර්ධනය වෙමින් පවතින හා සංවර්ධිත රටවල ග්‍රාමීය හා නාගරික ජන සංඛ්‍යා ව්‍යාප්තිය දක්වන රූප සටහන පරිශීලනය කරන්න. එහි දී සංවර්ධිත රටවල නාගරික ජන සංඛ්‍යාව හෙමින් වැඩෙන බව ඔබට දැකිය හැකි වේ.





**රූප අංක 3.7: ග්‍රාමීය සහ නාගරික ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය**

මූලාශ්‍රය: John Hancock and Alan Boult, 2001, G.C.S.E. Geography Revise Study Guide

නාගරික ජන සංඛ්‍යා ව්‍යාප්තිය අනුව විශේෂිත නගර බිහි වී ඇත. මිලියන නගර, නගරයාය, දැවැන්ත නගර මින් කීපයකි. 1990දී මිලියන පහකට වැඩි නගර තිහක් පමණ ලෝකයේ දක්නට ලැබිණි. ඒවායින් වැඩි ජන සංඛ්‍යාවක් සංවර්ධනය වෙමින් පවතින රටවල පිහිටීම විශේෂ ලක්ෂණයකි. මෑතක දී බිහි වූ දැවැන්ත නගර මිලියන 10ට වඩා වැඩි ජන සංඛ්‍යාවක් ඇති ඒවා වේ. මෙම දැවැන්ත නගර වැඩි වශයෙන් පිහිටා ඇත්තේ ආසියාවේ ය. උදාහරණ වශයෙන් බීජිං, මුම්බායි, කල්කටා, ජකර්තා, ඔසාකා, සෝල්, ෂැංහයි, ටෝකියෝ, පෙන්වා දිය හැකි ය. ස්ථානගත පිහිටීම, ප්‍රධාන වරාය, වෙළෙඳ මධ්‍යස්ථාන වීම, සම්පත් බහුල ව තිබීම, යටිතල පහසුකම් වැනි කරුණු ඒවායේ ජන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු වී තිබේ. සෑම මහාද්වීපයක ම මිලියන නගර දක්නට ලැබුණ ද ආසියා මහාද්වීපය තුළ නගර ව්‍යාප්තිය ඉහළ බව පහත 3.8 රූපයෙන් පෙනේ.

## ලෝකයේ මිලියන නගර




රූප අංක 3.8: මිලියන නගර මහාද්වීප අනුව ව්‍යාප්ත වී ඇති අන්දම

මූලාශ්‍රය : W.W.W City population. ole,2006-11-22 වෙබ් අඩවියේ දත්ත අනුව සකස් කරන ලදී.

**ක්‍රියාකාරකම්**


1. i. පහත සඳහන් මිලියන නගර මහාද්වීප අනුව වර්ග කරන්න.
   ii ඒවා ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| නිව්යෝක් | බුවනෝස් අයරිස් | ලන්ඩන් | කේප්ටවුන් |
| චිකාගෝ | රියෝද ජෙනෙයිරෝ | ඩැකා | ෂැංහයි |
| මෙක්සිකෝ සිටි | මදුරාසි (චෙන්නායි) | ටෝකියෝ | කල්කටා |

2. එක ම පරිමාණයකට අඳින ලද ලෝක ආකෘති සිතියම් තුනක් ටිෂූ කඩදාසියක් මත පිටපත් කර ගන්න. ඒවායේ පිළිවෙළින්
   - ජන සංඛ්‍යා ව්‍යාප්තිය
   - ප්‍රධාන කාර්මික ප්‍රදේශ, වරායන්, ප්‍රධාන නගර
   - ප්‍රධාන කඳු, ගංගා, තැනිතලා, කාන්තාර වෙන වෙන ම ලකුණු කොට නම් කරන්න.
3. ජන සංඛ්‍යා ව්‍යාප්ති සිතියම අනිත් සිතියම් දෙක මත තබා හොඳින් පරිශීලනය කර භූ විෂමතාවත් ජන සංඛ්‍යා ව්‍යාප්තියත් අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කිරීමට වාර්තාවක් ඉදිරිපත් කරන්න.

## 3.4 ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය

හෝමෝ සේපියන් නමැති මානවයා පෘථිවිය මත ජීවත් වූයේ මීට වසර දහස් ගණනකට පෙර ය. එවැනි මුල් යුගවල දී මිනිස් ගහනය පිළිබඳ නිශ්චිත වශයෙන් තොරතුරු ලබා ගැනීමට අපහසු ය. පසු කාලීන ව ජන සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ විධිමත් ජන සංගණන පවත්වා, අනතුරු ව ජන සංඛ්‍යා වර්ධනය පිළිබඳ නිවැරදි තීරණ වලට එළඹී ඇත. ඒ අනුව පහත සඳහන් රූප සටහන මඟින් ජන සංඛ්‍යා වර්ධනය පැහැදිලි වේ.





3.9 රූපය: ලෝක ජන සංඛ්‍යාවේ "J" හැඩැති ඝාතීය වර්ධන වක්‍රය

මූලාශ්‍රය: http://www.tribuneindia.com/2005/special/tribune_125/population.jpg.

> ලෝක ජන සංඛ්‍යා වර්ධනය, දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී ගමනක යෙදී, කෙටි කාලයක් තුළ ඝාතීය වර්ධනයක් ඇති ව ප්‍රසාරණාත්මක ගමන් මඟකට අවතීර්ණය වූ විකාශනයක් දක්වයි (3.9 රූපය).

### ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ ස්වභාවය


ලෝකයේ ජන සංඛ්‍යා වර්ධනය 1960 වර්ෂයේ දී බිලියන තුනක් වූ අතර 2007 වන විට බිලියන හත දක්වා වර්ධනය වී ඇත. 2050 වන විට මෙය බිලියන නවය දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය පහත ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.




3.10 රූපය : ලෝක ජන සංඛ්‍යා වර්ධනය, 1950 - 2050

මූලාශ්‍රය: U.S Census Bureau, International Data Base, August, 2006

## මහාද්වීප අනුව ලෝක ජන සංඛ්‍යා වර්ධනය




3.11 රූපය : ලෝකයේ විශේෂිත ප්‍රදේශ අනුව ජන සංඛ්‍යා වර්ධනය 1900 - 2000

මූලාශ්‍රය: http://www.newint.org/issue/309/facts.html


නා නා විධ කරුණු මුල් කර ගෙන ලෝකයේ විවිධ රටවල් තුළ එක සමාන ජන සංඛ්‍යා වර්ධනයක් දක්නට නො ලැබේ. එය මහාද්වීපයෙන් මහාද්වීපයට ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. ඉහත සඳහන් රූප සටහන නිරීක්ෂණය කිරීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

1900දී අප්‍රිකා මහාද්වීපයෙහි ජන සංඛ්‍යාව මුළු ලෝක ජන සංඛ්‍යාවෙන් 4.5%ක් පමණ වූ අතර වර්ෂ 2000දී 10% දක්වා වර්ධනය වී ඇති බැව් පෙනේ. අනිත් මහාද්වීපවල වර්ධනය ඉහත රූපසටහන ආශ්‍රයෙන් සොයා බලන්න.

### සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය

ලෝකයේ ජන සංඛ්‍යා වර්ධනයේ තවත් විශේෂ ලක්ෂණයක් වනුයේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අයත් වන මහාද්වීපවල ජන සංඛ්‍යා වර්ධනය ශීඝ්‍රයෙන් සිදු වීම යි.

සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධනය අඩු මට්ටමක් ගන්නා අතර සංවර්ධනය වෙමින් පවතින රටවල එය ඉහළ අගයක් ගනියි. උදාහරණ වශයෙන් පහත ප්‍රස්තාරය අනුව වර්ෂ 2050දී සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යාව බිලියන අටක් පමණ වන අතර සංවර්ධිත රටවල බිලියන 0.6ක් පමණ වේ යැයි ප්‍රක්ෂේපණය කර ඇත.




3.12 රූපය : සංවර්ධනය වෙමින් පවතින හා සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධනය, 1750 - 2100

ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන ප්‍රදේශ වශයෙන් දකුණු, අග්නි දිග සහ නැගෙනහිර ආසියාව හඳුන්වා දිය හැකි ය. උදාහරණ වශයෙන් 2006 නැගෙනහිර ආසියාවට අයත් චීනයේ සහ දකුණු ආසියාවට අයත් ඉන්දියාවේ ජන සංඛ්‍යාව පිළිවෙළින් මිලියන 1,312 හා 1,127 වේ.

මූලාශ්‍රය: John Hancock and Alan Boult, 2001, G.C.S.E Geography Revise Study Guide

**ක්‍රියාකාරකම**

- පාඩමේ ඇතුළත් වගු, ප්‍රස්තාර සහ වෙනත් පොත්පත්, සඟරා, පුවත්පත්, පින්තූර, ගැලීම් සටහන් ආදිය යොදා ගනිමින් පහත සඳහන් අනුමාතෘකා යටතේ "ලෝක ජන සංඛ්‍යා වර්ධනය" පිළිබඳ කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න.

  - නිර්වචනය
  - වර්ධනයට හේතු
  - ඉතිහාසය
  - ගැටලු
  - කලාප අනුව වර්ධනය

## ජන සංඛ්‍යාවේ වර්ධන වේගය

තෝරා ගත් රටක, නිශ්චිත වර්ෂයක දී ස්වාභාවික වර්ධනය සහ ශුද්ධ සංක්‍රමණ යන දෙක ම නිසා ජන සංඛ්‍යාවේ ඇති වන වැඩි වීම් හෝ අඩු වීමේ ශීඝ්‍රතාව ජන සංඛ්‍යා වර්ධනය ලෙස හැඳින්වේ.

ලෝකයේ ජන සංඛ්‍යා වර්ධනයට ප්‍රධාන කරුණු දෙකක් බලපායි.




ලෝකයේ ජන සංඛ්‍යා වර්ධන වේගයේ ස්වරූපය පහත වගුවෙන් පැහැදිලි වේ.

3.5 වගුව
ලෝකයේ ජන සංඛ්‍යා වර්ධන වේගය


| | |
|---|---|
| වසරකට | 7,77,60,000 |
| මාසයකට | 6,4,80,000 |
| දිනකට | 2,16,000 |
| පැයකට | 9000 |
| මිනිත්තුවකට | 150 |

මූලාශ්‍රයඃ medindia-calculators World Population Clock http:/GEOGRAPHY.about.com/od/listsa/2050 pop.htm

ඉහත වගුව අනුව ලෝක ජන සංඛ්‍යා වර්ධන වේගයේ ස්වරූපය පැහැදිලි වේ.

## වර්ධන අවධි

ඉහත කරුණු මුල් කර ගෙන ලෝක ජන සංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධීන් හතරක් හඳුනා ගෙන ඇත. එය 3:13 රූපය මගින් දක්වේ.




3.13 රූපය : ජන සංඛ්‍යා වර්ධන අවධීන්

මූලාශ්‍රයඃ John Hancock and Alan Boult, 2001, G.C.S.E Geography Revise Study Guide

මෙම අවධිවල ජන සංඛ්‍යාවේ උපත් අනුපාතිකය, මරණ අනුපාතිකය සහ ජන සංඛ්‍යාවේ වර්ධනය එකිනෙකට වෙනස් වේ.

**ක්‍රියාකාරකම්:**

1. ජන සංඛ්‍යා වර්ධනයට අදාළ අවධි හතරේ ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් අනු මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

   i. උපත් අනුපාතිකය

   ii. මරණ අනුපාතිකය

   iii. ජන සංඛ්‍යාවේ වෙනස් වීම

2. i. පළමු අවධිය සහ හතර වන අවධිය අතර වෙනස්කම් කෙටියෙන් දක්වන්න.
   ii. එම වෙනස්කම් ඇති වීමට බලපෑ හේතු දෙක බැගින් ලියන්න.

## ජන සංඛ්‍යාව දෙගුණ වීම

ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගත වන කාලය තීරණය වීම කෙරෙහි ජන සංඛ්‍යා වර්ධන වේගය බලපායි. මේ අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යාව දෙගුණ වීමට කෙටි කාලයක් ගත වන අතර සංවර්ධිත රටවලට ඒ සඳහා දිගු කාලයක් ගත වේ. එම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇත.

3.6 වගුව

තෝරා ගත් රටවල ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගත වන කාලය

| රට | 1994 ජන සංඛ්‍යාව | 2015 ප්‍රක්ෂේපිත ජන සංඛ්‍යාව | වාර්ෂික වර්ධන වේගය | දෙගුණ වීමට ගතවන කාලය අවුරුදු |
|---|---|---|---|---|
| චීනය | 1208.1 | 1441.7 | 1.1 | 64 |
| ඉන්දියාව | 918.6 | 1263.7 | 1.9 | 37 |
| ඇ.එ.ජනපදය | 260.6 | 309.1 | 1.0 | 70 |
| ඉන්දුනීසියාව | 194.6 | 252.0 | 1.6 | 44 |
| ජපානය | 124.8 | 125.9 | 0.3 | 233 |
| බංග්ලාදේශය | 117.8 | 174.8 | 2.2 | 32 |
| නයිජීරියාව | 108.5 | 190.0 | 3.0 | 23 |
| මෙක්සිකෝව | 91.8 | 124.2 | 2.1 | 33 |
| තුර්කිය | 60.8 | 82.1 | 2.0 | 35 |
| දකුණු අප්‍රිකාව | 40.5 | 61.5 | 2.2 | 32 |
| ප්‍රංශය | 57.7 | 60.5 | 0.4 | 175 |

මූලාශ්‍රය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1998, උසස් පෙළ මානුෂ භූගෝල විද්‍යාව 1 කොටස

## 3.5 ලෝක ජන සංඛ්‍යාවේ වෙනස්වීම්

ලෝක ජන සංඛ්‍යාවේ වෙනස් වීම් ආශ්‍රිත ව නව ප්‍රවණතා රැසක් ම සිදු වන යුගයකට ලෝක ප්‍රජාව අවතීර්ණය වී ඇත.

### ලෝක ජන සංඛ්‍යාව වෙනස් වීමට බලපාන සාධක

ලෝක ජන සංඛ්‍යාව වෙනස් වීම කෙරෙහි බලපාන සියලු ම කරුණු උපත්, මරණ සහ සංක්‍රමණ යන සාධක තුන යටතේ ගොනු වී ඇති බැව් පැහැදිලි වේ. ඒවා පහත දැක්වෙන පරිදි ගණනය කළ හැකි ය.

දළ උපත් අනුපාතිකය $= \dfrac{\text{වසරකට උපත් සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව}} \times 1000$

දළ මරණ අනුපාතිකය $= \dfrac{\text{වසරකට මිය යන සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව}} \times 1000$

ශුද්ධ සංක්‍රමණ $= \dfrac{\text{ආගමනය} \quad \text{විගමනය}}{\text{මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව}} \times 1000$

මෙම ප්‍රධාන කරුණු තුන මගින් සිදු වන ජන සංඛ්‍යාවේ වෙනස් වීම් මුළු ලෝකයට ම එක සමාන නො වන අතර එය කලාපයෙන් කලාපයට සහ රටෙන් රටට වෙනස් ය. මීට අමතර ව ජන සංඛ්‍යාවේ වෙනස්වීම්වලට බලපාන ලද කරුණු රාශියක් පෙන්වා දිය හැකි ය. එනම්,

1. ලෝකයේ විවිධ රටවල සිදු වන යුධ කටයුතු නිසා ජන සංඛ්‍යාව වෙනස් වීම.
2. විවිධ රටවල් අනුගමනය කරන ජන සංඛ්‍යා ප්‍රතිපත්ති හේතු වීම.
3. සංවර්ධිත රටවල සහ සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධන වේගයේ වෙනස් වීම.
4. ලෝකය සමස්තයක් ලෙස ගත් විට ජන සංඛ්‍යා වර්ධන වේගය පහත වැටීම.

ලෝක ජන සංඛ්‍යා වෙනස් වීම් අධ්‍යයනය කිරීමේ දී පහත සඳහන් කරුණු ඉස්මතු වී පෙනේ.

**ලෝක ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිත වෙනස් වීම්**

- 2006දී ලෝක ජන සංඛ්‍යාව බිලියන හතකට ආසන්න වීම.
- සංවර්ධනය වෙමින් පවතින කලාපවල 1950දී ලෝක ජන සංඛ්‍යාවෙන් 68%ක් ජීවත් වූ අතර 1998දී මේ ප්‍රමාණය 80% දක්වා වැඩි වීම.
- 2050 වන විට මුළු ජන සංඛ්‍යාවෙන් 88%ක් ම සංවර්ධනය වෙමින් පවතින කලාපවලට අයත් වීම. ඉන් ආසියාව මුල් ස්ථානය ගැනීම.
- 2006දී ලෝකයේ වැඩි ම ජන සංඛ්‍යාවක් පැවති චීනයේ ජන සංඛ්‍යාව මිලියන 1,311.4ක් වූ අතර, 2050 වන විට චීනය අභිබවා ඉන්දියාවේ ජන සංඛ්‍යාව වර්ධනය වීම.

**ලෝක ජන සංඛ්‍යා වර්ධන වේගය ආශ්‍රිත වෙනස් වීම්**

- වර්තමාන ජන සංඛ්‍යා වර්ධන වේගය ලෝක මට්ටමෙන් අඩු වීම.
- සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධන වේගය ශීඝ්‍රයෙන් අඩු වෙමින් පැවතීම.
- ඇතැම් යුරෝපා රටවල ජන සංඛ්‍යා වර්ධන වේගය සෘණ අගයක් ගැනීම.

එම රටවල ජන සංඛ්‍යා වර්ධනය මන්දගාමී ව සිදු වන අතර ඇතැම් ප්‍රදේශවල කිසිදු වැඩි වීමක් සිදු නොවීම. උදා : 2006 ඔස්ට්‍රියාවේ වර්ධනය 0.0 වීම.

- සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධන වේගයේ අඩු වීම ඉතා සුළු ප්‍රමාණයකින් සිදු වීම. එහෙත් චීනයේ ජන සංඛ්‍යා වර්ධන වේගය 2006 වන විට 0.6% දක්වා අඩු වී ඇත. එසේ වර්ධන වේගය අඩු වීමට රජය අනුගමනය කරන එක් දරු උපත් සංකල්පය වැනි රජයේ විවිධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තදින් ම බලපා ඇත.
- එකිනෙකට වෙනස් තත්ත්වයන් නිසා ජන සංඛ්‍යාව වර්ධනය වීමට ගන්නා කාලය ලෝක කලාප අනුව වෙනස් වීම. උදහරණ: ජපානයේ ජන සංඛ්‍යාව දෙගුණ වීමට අවුරුදු 233 ගන්නා අතර නයිජීරියාවේ එය අවුරුදු 23ක් පමණ වීම.

## ලෝක නාගරික ජන සංඛ්‍යාවේ වෙනස්වීම්

3.7 වගුව

තෝරා ගත් රටවල නාගරික ජන සංඛ්‍යාවේ වෙනස් වීම්, 1992 - 2006

| කලාපය/ රට | 1992 (%) | 2006 (%) | 2008 (%) |
|---|---|---|---|
| **සංවර්ධිත රටවල්** | | | |
| ඇ.එ.ජනපදය | 74 | 79 | 82 |
| එක්සත් රාජධානිය | 90 | 89 | 90 |
| ස්විඩනය | 83 | 84 | 85 |
| ප්‍රංශය | 73 | 76 | 77 |
| ජර්මනිය | 86 | 88 | 74 |
| **සංවර්ධනය වෙමින් පවතින රටවල්** | | | |
| **අප්‍රිකාව** | | | |
| මාලි | 18 | 30 | 32 |
| ටැන්සානියාව | 19 | 32 | 25 |
| **දකුණු ආසියාව** | | | |
| බංග්ලාදේශය | 13 | 23 | 27 |
| නේපාලය | 7 | 14 | 17 |
| **නැගෙනහිර ආසියාව** | | | |
| චීනය | 21 | 37 | 43 |
| දකුණු කොරියාව | 65 | 82 | 81 |

මූලාශ්‍රය : World Population Data Sheets 1992, 2006

- ඉහත වගුවට අනුව මුළු ලෝකයේ ම නගර ආශ්‍රිත ජන සංඛ්‍යාවේ ප්‍රසාරණයක් දක්නට ලැබීම.

  උදා : 1992 ඇමරිකා එක්සත් ජනපදයේ නාගරික ජන සංඛ්‍යාව 74%ක් වූ අතර 2006 දී 79% දක්වාත් 2008 දී 82% දක්වාත් වැඩි වී ඇත.
- 1992 බංග්ලාදේශයේ නාගරික ජන සංඛ්‍යාව 13% ක් වූ අතර 2006 දී 23% දක්වාත් 2008 දී 27% දක්වාත් වර්ධනය වීම.
- නාගරික ජන සංඛ්‍යාවේ වෙනස් වීම් සම්බන්ධ ව තවත් වැදගත් කරුණක් වන්නේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල තත්ත්වයන් එකින් එකට වෙනස් වීම යි.

- සංවර්ධිත රටවල නගර ආශ්‍රිත වර්ධනය අඩු වී ඇති අතර සංවර්ධනය වෙමින් පවතින රටවල නගර වේගයෙන් ප්‍රසාරණය වෙමින් පැවතීම.
- වෙරළ ආශ්‍රිත නගර බිහි වීම. උදාහරණ: ඩැකා, බුවනොස් අයර්ස්, ෂැංහයි,



3.14 රූපය : වෙරළ ආශ්‍රිත නගරයක්

- වෙන් වෙන් වශයෙන් ස්ථානගත වූ නගර එක දිගට ම සංවර්ධනය වීම.
- 2050 ප්‍රක්ෂේපිත ජන සංඛ්‍යා දක්වා ඇති විශාල නගර රැසක් ම සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට අයත් වීම.

උදාහරණ: ලාගෝස් (නයිජීරියාව), මුම්බායි (ඉන්දියාව), ඩැකා (බංග්ලාදේශය), සාඕ පෝලෝ (බ්‍රසීලය), කරච්චි (පාකිස්ථානය), දිල්ලි (ඉන්දියාව) සහ ජකාර්තා (ඉන්දුනීසියාව) වේ.


## වයස් ව්‍යූහය පිළිබඳ වෙනස්කම්

- පොදු වශයෙන් මුළු ලෝකයේ ම උපත් අනුපාතිකය, සාමාන්‍ය සාපල්‍යතා මට්ටම යන අංශවල අඩු වීමක් පෙන්නුම් කිරීම.
- එහෙත් උපතේ දී ආයු අපේක්ෂා අනුපාතිකය වැඩි වීමක් දක්නට ලැබීම.

  උදාහරණ: සංවර්ධනය වෙමින් පවතින රටවල උපතේ දී ආයු අපේක්ෂා මට්ටම අවු. 60-70 දක්වා ඉහළ ගොස් ඇති අතර යුරෝපා රටවල අවු 8085 දක්වා වීම. ජපානය අවු 80ක් පමණ වීම.
- ළමා මරණ සංඛ්‍යාව අඩු වීම. (ඉහළ සෞඛ්‍ය හා වෛද්‍ය පහසුකම්, දැනුවත් කිරීමේ වැඩසටහන්)
- වයස්ගත සංඛ්‍යාව වැඩි වීම.
- යුරෝපා රටවල වයස්ගත වූවන්ගේ ප්‍රතිශතය ආසියා රටවලට වඩා ඉහළ අගයක් ගැනීම.
- ජන සංඛ්‍යා ව්‍යූහයේ සිදු වූ ඉහත වෙනස් වීම් නිසා සංවර්ධිත රටවල ජන සංඛ්‍යා පිරමීඩයේ හැඩය වෙනස් වීම.
- අනාගතයේ දී ජන සංඛ්‍යා ව්‍යූහයේ වර්ධනය ස්ථාවර වීමට ඉඩ ඇති බැවින් ස්ථම්භයක ස්වරූපය ගන්නා බැව් පෙන්වා දී ඇත.
- ස්ත්‍රී ජන සංඛ්‍යාව වැඩි වීමක් සහ පිරිමි සංඛ්‍යාව අඩු වීමක් දක්නට ලැබීම.

### සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය නිසා මතු වන ගැටලු

| ආර්ථික | කෘෂිකාර්මික | සමාජයීය | සෞඛ්‍ය |
|---|---|---|---|
| 1. රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා මුදල් වැය වීම.<br>2. ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා විශාල වියදමක් දැරීමට සිදු වීම | 1. ඒක පුද්ගල භූමි ප්‍රමාණය අඩු වීම<br>2. ඉඩම් කැබලි වීම<br>3. වනාන්තර එළි කිරීම නිසා වන සම්පත් විනාශ වීම. | 1. නිවාස හිඟය<br>2. මුඩුක්කු පැල්පත් නිවාස බිහි වීම<br>3. කුණු කසළ එකතු වීම. | 1. වසංගත රෝග පැතිර යාම ඉක්මන් වීම<br>2. පිරිසිදු පානීය ජලය හිඟ වීම. |



3.15 රූපය : නාගරික ප්‍රදේශවල නිවාස තදබදය

### 3.6 සංක්‍රමණික රටා

මිනිසාගේ සාමාන්‍ය පදිංචි ස්ථානයේ වෙනසක් කරවන අන්තර් භූගෝලීය විචලතාව සංක්‍රමණ ලෙස පෙන්වා දිය හැකි අතර, එය පරිසරාත්මක වෙනස්වීම්වලට හැඩ ගැසීමේ ක්‍රමයක් ලෙස ද නිර්වචනය කළ හැකි ය.

### සංක්‍රමණ වර්ග

ලෝක ඉතිහාසයයේ සිදු වූ සංක්‍රමණ විග්‍රහ කර බලන විට ප්‍රධාන වර්ග දෙකක් හඳුනා ගෙන ඇත.

1. අභ්‍යන්තර සංක්‍රමණ
2. බාහිර සංක්‍රමණ.

### අභ්‍යන්තර සංක්‍රමණ

අභ්‍යන්තර සංක්‍රමණ පහත සඳහන් ආකාරයට සකස් වී ඇත.

ගමෙන් ගමට
නගරයෙන් නගරයට
ගමෙන් නගරයට
නගරයෙන් ගමට

ඉහත සටහනට අනුව අභ්‍යන්තර සංක්‍රමණ සිදු වීමට විවිධ කරුණු බලපාන බව පෙන්වා දිය හැකි ය. යුද්ධ බිය, රැකියාවන් ලබා ගැනීමේ අරමුණු, අලුතින් ඉඩම් මිලදී ගැනීමේ අපේක්ෂාව වැනි කරුණු නිසා **(ගමෙන් ගමට)** සංක්‍රමණය වීම සිදු වේ. **නගරයකින් නගරයකට** සංක්‍රමණය වීම කෙරෙහි විවිධ පහසුකම් ලබා ගැනීම, රැකියාවල ස්ථානගත මාරුවීම්, උසස් ජීවන තත්ත්වයන් අපේක්ෂාව, උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ අරමුණු, නව රැකියා ලබා ගැනීමේ අවශ්‍යතාව වැනි කරුණු බලපා ඇත.

**නගරයෙන් ගමට** සංක්‍රමණය වීම කෙරෙහි පහත සඳහන් කරුණු හේතු වේ. සැපදායී පරිසරයක් තුළ ජීවත් වීමේ කැමැත්ත, විවේකය යහපත් ව ගත කිරීමට ගම්බද ප්‍රදේශ තෝරා ගැනීම, පාරම්පරික දේපළ ආරක්ෂා කිරීමේ අරමුණ මේ අතුරින් වඩාත් වැදගත් ඒවා ය. මෙවැනි සංක්‍රමණ සංවර්ධිත රටවල විශේෂයෙන් දක්නට ලැබේ.

**ගමෙන් නගරයට** සිදු වන සංක්‍රමණය සංවර්ධනය වෙමින් පවතින රටවල බහුල වශයෙන් දක්නට ලැබේ. මෙයට බලපා ඇති කරුණු රාශියකි. ඒවා අතරින් රැකියාවක් ලබා ගැනීම උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාව, ගමනාගමන පහසුව, උසස් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමේ අභිලාෂය යනාදී කරුණු වැදගත් වේ.

**බාහිර සංක්‍රමණ.**

| | |
|---|---|
| සංවර්ධිත රටවලින් | - සංවර්ධනය වෙමින් පවතින රටවලට |
| සංවර්ධනය වෙමින් පවතින රටවලින් | - සංවර්ධිත රටවලට |
| සංවර්ධිත රටවල සිට | - වෙනත් සංවර්ධිත රටවලට |
| සංවර්ධනය වෙමින් පවතින රටවලින් | - වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවලට |

**බාහිර සංක්‍රමණවලට අදාළ උදාහරණ කීපයක් පහත දැක්වේ.**

- උපදේශකවරු ලෙස ව්‍යාපෘතීන්ට තම සේවය ලබා දීමට පැමිණෙන විශේෂඥවරුන්, අයෝජනයන් සඳහා පැමිණෙන්නන් මෙන් ම සංචාරකයින් ලෙස ඉහළ ආදායම් ලබන රටවලින් පැමිණෙන පුද්ගලයින් ද සංවර්ධිත රටවලින් සංවර්ධනය වෙමින් පවතින රටවලට තාවකාලික ව සංක්‍රමණය වන්නෝ වෙති.
- නිපුණතා බහුල වූ ශ්‍රමය, සංවර්ධනය වෙමින් පවතින රටවලින් සංවර්ධිත රටවලට සංක්‍රමණය වීමක් දක්නට ඇත. උදාහරණ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, විදුලි කාර්මිකයින්, මිනින්දෝරුවන් ආදීන්. මීට අමතර ව උසස් අධ්‍යාපනය සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවලින් සංවර්ධිත රටවලට ඇදී යාමත්, සුදුසුකම් ලැබූ පසුව ඒ රටවල ම පදිංචි වීමත් අද බහුල ව සිදු වේ. උදාහරණ එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව වැනි රටවලට සිදු වන සංක්‍රමණ.
- ජනාධික බටහිර යුරෝපා රටවල සිට වැඩි පහසුකම් සහිත වෙනත් සංවර්ධිත රටවලට සංක්‍රමණය වීම. උද එක්සත් රාජධානියේ සිට ඕස්ට්‍රේලියාව හෝ කැනඩාවට.
- නිපුණතා නොමැති ශ්‍රමය සංවර්ධනය වන රටවල සිට වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවලට ඇදී යාම. උදාහරණ මැදපෙරදිගට ගෘහ සේවිකාවන් ලෙස හෝ හෝටල්වල රැකියා සඳහා සංක්‍රමණය වීම. විවිධ හේතූන් මත දේශ සීමා තරණය කරන අසරණ වූ සරණාගත කොටස්වල සංක්‍රමණ. උදා: ඉතියෝපියාව, රුවන්ඩාව

"අපේ ඇමරිකානු ජනතාව බලා ගන්නේ තුන්වන ලෝකයෙන් පැමිණි වෛද්‍යවරුන් විසිනි." ඇමරිකානු නායකයෙකුගේ ඉහත ප්‍රකාශය අනුව බාහිර සංක්‍රමණ නිසා මුළු ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇති ආකාරය පැහැදිලි වේ. එසේම බාහිර සංක්‍රමණවලින් එක් පාර්ශවයකට පාඩු සිදු වන අතර අනෙක් පාර්ශවයට වාසි සිදු වන බව පෙනේ.

## සංක්‍රමණ ඇති වීමට හේතු

සංක්‍රමණ ඇති වීමට හේතු සලකා බැලීමේ දී තල්ලු කිරීමේ සහ ඇද ගැනීමේ සාධක ඉතා ම වැදගත් වේ. ලෝකයේ කුමන අවස්ථාවක දී හෝ කුමන ස්ථානයක හෝ සංක්‍රමණ සිදු වූවා නම්, එය ඉහත සඳහන් කරුණු වර්ග දෙකෙන් එකකට අයත් ය.

| තල්ලු කිරීමේ සාධක | ඇද ගැනීමේ සාධක |
|---|---|
| ▪ රැකියා දුලබ වීම | • රැකියා සුලභ වීම |
| ▪ නිවාස හිඟ වීම | • ඉහළ ආදායම් ලබා ගත හැකි වීම |
| ▪ වායු දූෂණය | • උසස් ජීවන මට්ටමක් කරා එළඹීමේ පහසුව |
| ▪ පරිසර දූෂණය | • උසස් මට්ටමේ පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථා |
| ▪ ශබ්ද දූෂණය | • යටිතල පහසුකම් බහුල වීම |
| ▪ අඩු අධ්‍යාපන මට්ටම | • හිතකර පරිසරය |
| ▪ දුර්වල සෞඛ්‍ය පහසුකම් | • ඉහළ අධ්‍යාපන පහසුකම් තිබීම |
| ▪ යටිතල පහසුකම් අඩු වීම | • හිත් ගන්නා සෞඛ්‍ය පහසුකම් |
| ▪ දුර්වල ප්‍රවාහන සේවයන් | • ඉහළ සමාජ ස්තරයකට ඇතුළු වීමේ කැමැත්ත |
| ▪ යුද්ධ ත්‍රස්තවාදී ක්‍රියා | • උසස් තාක්ෂණ මට්ටම නිසා ලැබෙන වාසි |
| ▪ ස්වභාවික ආපදා | • ස්වභාවික ආපදා අඩු වීම |
| ▪ දේශපාලන අස්ථාවරත්වය | • දේශපාලන ස්ථාවරත්වය |
| ▪ සාගතය | |
| ▪ වසංගත රෝග | |

## සංක්‍රමණ නිසා ඇති වන ප්‍රතිවිපාක

- බුද්ධි ගලනය නිසා පුහුණු ශ්‍රමිකයන් අහිමි වීම.
- ශ්‍රම ගලනය
- සරණාගතයින් පිළිබඳ ගැටලුව
- ජන සංඛ්‍යා සංයුතියේ/ව්‍යුහයේ වෙනස්කම් ඇති වීම
- නාගරික ජන සංඛ්‍යාවේ වර්ධනය
- දෙමාපිය දූදරු සබඳතා අඩුවීම
- සමාජ දූෂණය
- සංස්කෘතික දූෂණය



3.16 රූපය: සරණාගතයින්

ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ලෝකයේ රටවල් අතර බුද්ධි ගලනය සිදු වේ. එය සංවර්ධිත රටවල් කරා බුද්ධි ගලනය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් කරා බුද්ධි ගලනය වශයෙන් වර්ග කළ හැකි ය. දෙ වන ලෝක යුද්ධයෙන් පසුව සහ යටත් විජිතකරණයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස යුරෝපා රටවල රැකියා වෙළෙඳපොළ විශාල වීම, ආර්ථික ක්‍රියාවලිය සක්‍රීය වීම වැනි කටයුතු සිදු වූ බැවින් ඉතා ශීඝ්‍රයෙන් එම රටවල් කරා බුද්ධි ගලනය සිදු විය. යුරෝපා ජාතීහු ඇමරිකාවටත්, ඕස්ට්‍රේලියාවටත් මහා පරිමාණයෙන් සංක්‍රමණය වීමට පටන් ගත්හ. ආසියාතිකයෝ කුඩා පරිමාණ වශයෙන් යුරෝපා රටවලට සහ ඇමරිකා මහාද්වීපයට සංක්‍රමණය වූහ. මෙම ගලනය නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට බුද්ධිමතුන් අඩු වුවත් සංක්‍රමණය වූ රටට වාසිදායක වේ. බුද්ධිගලනය හා ශ්‍රම ගලනය, මුල් යුගයේ සිට ම පැවතුණි. නමුත් සමාජ රටාව සංකීර්ණ වෙත් ම මෙම ක්‍රමය වෙනස් වී වෙනත් ස්වරූපයක් ගන්නා ලදී. ඒ අතර ආර්ථික හා වෘත්තීය වාසි සඳහා මැද පෙරදිග රටවලට හා කොරියාව වැනි රටවලට පැමිණෙන තාවකාලික සංක්‍රමණිකයන් ක්‍රමයෙන් වර්ධනය වීය. උදාහරණ වශයෙන් නිපුණතා මට්ටම අඩු ගෘහ සේවය පෙන්වා දිය හැකි ය.